# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 9 දරන රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය අර්ථසාධක සංගම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 අප්‍රේල් මස 22 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 අප්‍රේල් මස 25 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 30 යි 　　　　 තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 9 දරන රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 අප්‍රේල් මස 22 වන දින]

එල්. ඩී.—ඕ. 10/84

රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 9 දරන රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

2. 1983 අංක 18 දරන පනත මගින් අවසන් වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා අන්‍යොන්‍ය අර්ථසාධක සංගම් ආඥාපනතේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:— 283 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

(i) ඒ වගන්තියේ (3) වන උපවගන්තිය (4) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්; සහ

(ii) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:—

"(3) එසේ නම් කරන ලද සාමාජිකයන්ට භාණ්ඩාගාරයේ ලේකම්වරයා විසින් කලින් කල විධාන කරනු ලබන ප්‍රමාණයක පාරිශ්‍රමික සංස්ථාවේ අරමුදලින් ලැබිය යුතු ය:

එසේ වුව ද එම පාරිශ්‍රමිකය, එක් අයකුට එක් මාසයක් සඳහා රුපියල් එක් සියයක් හෝ යම් මාසයකින් කොටසක් සඳහා එහි සමානුපාතිකයක් හෝ නොඉක්ම විය යුතු ය.".

3. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 2 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ 2 වන උපවගන්තියෙහි අතුරු වගන්තිය වෙනුවට පහත දැක්වෙන අලුත් අතුරු වගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

"එසේ වුව ද එම පාරිශ්‍රමිකය එක් මාසයක් සඳහා රුපියල් හත්සිය පණහක් හෝ යම් මාසයකින් කොටසක් සඳහා එහි සමානුපාතිකයක් හෝ නොඉක්මවිය යුතු ය.".

ඒ 088207—6,725 (86/01)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් යෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.